
## ඇත්ත කෙටි කතාව

# ශ්‍රී සත්‍ය සායිබාබා තුමා



ශ්‍රී සත්‍ය සායිබාබා අද අප අතර නැත. එතුමා ප්‍රේම සායිබාබා නමින් ඉන්දියාවේ කර්නාටක් ප්‍රාන්තයේ ග්‍රාමයක උපත ලබනවායයි විශ්වාස යක් පවතී. මම එතුමන් සතර වරක් බැහැදැක ඇත්තෙමි. දෙවරක් ඉන්දියාවේ බැංගලෝර් හි පුට්ටාපති ග්‍රාමයෙහි ද, වරක් බැංගලෝර් හි වයිට්ෆීල්ඩ් හි දීද, අනෙක් වර දකුණු ඉන්දියාවේ මදුරාසියට ආසන්න කොඩික්කනෙහි ප්‍රදේශයෙහි දී ද වේ.

සායිබාබාතුමන් කෙරෙහි අප තුළ විශ්වාසයක් ඇතිවීමට මුල්වූ කරුණ මෙසේ ය. සෞඛ්‍ය හේතූන් මත අපගේ වැඩිමහල් දියණිය බිහිකිරීමට නියමිත දිනට තෙමසක පටන් රෝහලේ නැවතී සිටීමට මා බිරිඳ අනෝමාට සිදුවීය. රෝහල වූයේ ලන්ඩනයේ එකල අප සිටි නිවසේ සිට විනාඩි දහයකින් යා හැකි දුරිනි. එහෙත් වෛද්‍යවරුන් මගේ බිරිඳට ගෙදර ඒමට අවසර දුන්නේ ම නැත. දිනපතාම ඇය ගෙදර ගොස් එන්නට ඔවුන්ගෙන් අවසර යැද සිටියද එය නොලැබිණ. මේ හේතුව නිසා ඇය සිටියේ ඉතා කණස්සල්ලෙනි.

දිනක් අනෝමා බැලීමට රෝහලට පැමිණි, මා එවක රැකියාව කළ නීතිඥ සමාගමේ හිමිකාරිය ඉන්ද්‍රාණි පීරිස් මහත්මිය ගෙදර යාමට ඉඩ දෙන ලෙස සායිබාබාගෙන් ඉල්ලා සිටින ලෙසට අප දැනුවත් කළාය. අපි එසේ කළෙමු. පසුදින උදේ පැමිණි දොස්තර මහතාට මා බිරිඳ සුපුරුදු පරිදි ගෙදර යන ඉල්ලීම ඉදිරිපත් කළාය. කිසිදු පැකිලීමකින් තොරව වෛද්‍යවරයා එක්වරම අවසර දුන්නේය. පසුවදා වූ සෙනසුරාදා ගෙදර ගොස් නැවත සවස රෝහලට එන්නට යයි කීවේ ය. අපේ පැහැදීම එයයි.

### පළමුවර සායිබාබා තුමා හමුවීම

ඒ 1989 දෙසැම්බර් මාසයයි. මේ වන විට අපට දියණියන් දෙදෙනෙකි. පළමුවැන්නා අවුරුදු දෙකක් වූ අතර, දෙවැන්නාට සති හයකි. අපගේ බලාපොරොත්තුව වූයේ ශ්‍රීලංකාවට ගොස් ඉන්දියාවට යාමටය. ශ්‍රීලංකාවට ගිය අපි, මගේ මවත්, බිරිඳගේ දෙමාපිය නුත්, මගේ ලේලියක වන ප්‍රියානිත් කැටුව ඉන්දියාවට ගියෙමු. පසුවදා උදේ රැයින්ම පුට්ටාපති ග්‍රාමයට සම්ප්‍රාප්ත වූ අපි උදෑසන පූජාව පැවැත්වෙන ශාලාව කරා පියනැගීමු.

මා අත මා වැඩිමහල් දියණිය සහ වීඩියෝ කැමරාව ද විය. දිගු කතාවක් කෙටියෙන් කිවහොත් මා සායිබාබාතුමා වීඩියෝ කළ දර්ශනවල ඡායාරූප නැත. කැමරාවේ සටහන්ව තිබුණේ ගීත ගායනා ශබ්ද පමණි.

පූජාවෙන් අනතුරුව දහවල ආහාරගෙන අපි සෙවනක් බලා ගියෙමු. දියණිය බලා ගන්නැයි අම්මාට බාරදුන් මම තනිවම එම පූජා භූමියේ ඇවිදිමින් සිටියෙමි.

එක් තැන ඇරී තිබුණු ගේට්ටුවකින් ඇතුළට ගිය මා නතර වූයේ තනිතට්ටුවට සෑදූ කුඩා නිවසක් තුළ ය. එහි ඇතුළත වායුසමනය කළාක් මෙන් සිසිලසක් දැනිණ. සාලයේ අඩි හයක පමණ උස රාමු කරන ලද ශිර්ඩි බාබාගේ (සායි බාබාගේ පෙර ආත්මය) සහ සායිබාබාගේ ඡායාරූප දෙකක් වීය. ඒවා නරඹමින් මම ගේ තුළ ඇවිදිමින් සිටියෙමි.

එක්වරම කිසිවෙකු මගේ කරට අත තබනවා දැනිණ. හිස හරවා බැලූ මා දුටුවේ සිනා මුහුණින් යුතුව ටිකක් ඉවත් වන ලෙස අතින් සංඥා කරමින් සිටින දිග රැවුලකින් යුත් තේජාන්විත සීක් ජාතිකයෙකි. මම වහා ඉවත්වීමි. අරුමයෙකි. ඔහු පසුපස වූයේ භගවාන් ශ්‍රී සත්‍ය සායිබාබා ය.

මා මේ නොදැන පිවිස ඇත්තේ ප්‍රශාන්ති නිලයම් යන එතුමන්ගේ නිවසටය. එකල එහි කිසිම ආරක්ෂකයෙකු නොවීය. දැන් මම එතුමන්ගේ මග ද අහුරාගෙන සිටිමි. කුමක් කළ යුතුදැයි මට සිහියක් නොවීය. මම වහා පස්සට පැනගතිමි. මා දෙස හිස හරවා බැලූ සායිබාබා තුමා කිසිත් නොකියාම ගෙයින් එළියට පය තැබීය. එතුමන් පසුපස පොලිස් නිලධාරියෙකුද වීය. මමද ඔවුන් පසුපස ගමන් කළෙමි. ගේට්ටුව අසළ නවතා තිබූ බෙන්ස් රථයකට ඔව්හු ගොඩවූහ. පිටත්වීමට පෙර මා දෙස හිස හරවා බැලූ සායිබාබාතුමා මඳ සිනාවක් පෑහ. රථය පිටත්වී නොපෙනී යනතුරු මම බලා සිටියෙමි.

**නීතිඥ අනුර හෑගොඩ**

# ලන්ඩනයේ ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළිය

## Sunday 10th July 2011




## Pencil & Eraser

# පැන්සල සහ මකන රබර් කෑල්ල




**One day there was a dialogue between the Pencil and the Eraser.**

**Pencil :** I'm sorry....

**Eraser:** For what ? You didn't do anything wrong.

**Pencil :** I'm sorry 'cos you get hurt because of me. When ever I make a mistake, you're always there to erase it. But as you make my mistakes vanish, you lose a part of yourself. You get smaller and smaller each time.

**Eraser :** That's true. But I don't really mind. You see, I was made to do this. I was made to help you whenever you do something wrong. Even though one day, I know I'll be gone and you'll replace me with a new one, I'm actually happy with my job. So please, stop worrying. I hate seeing you sad.

I found this conversation between the pencil and the eraser very inspirational. I thought about it and drew parallels with our life in this world.

Parents are like the erasers whereas their children are the pencil. They're always there for their children, cleaning up their mistakes.

Sometimes along the way... they get hurt, and become smaller (older, and finally pass on). Though their children will eventually find someone new (friends, colleagues, relatives and later, life-partners), but parents are still happy with what they do for their children, and will always hate seeing their precious ones worrying, or sad.

දිනක් පැන්සල සහ අකුරු මකන රබර් කෑල්ල හෙවත් ඉරේසරය අතර මෙබඳු දෙබසක් ඇතිවුණේ ය.



**පැන්සල** -මට හරි කණගාටුයි!

**රබර් කෑල්ල**- ඇයි මොකටද කණගාටුවෙන්නෙ ? ඔයා කිසි වැරැද්දක් කළේ නැනේ මෙතන.

**පැන්සල** - මට කණගාටු මම නිසා ඔයා සැහෙන්න රිදවගන්නවා. වේදනාවට පත් වෙනවා. මම කිසියම් වැරැද්දක් කරපු ගමන් ඔබ ඉන්නවා මගේ ළඟින්ම ඉක්මනින් මගේ ඒ වැරැද්ද මකලා දාන්න. ඒ එක්කම මට තේරෙනවා ඔබ මගේ වැරදි අහෝසිකර දමන හැම සැරේකම ඔබේ කොටසක් අඩුවෙලා යනවා. එන්න එන්නම ඔබ පුංචි වෙනවා. එහෙම වෙලා දවසක මං හන්දම නැත්තටම නැතිවෙලා යනව නේද?

**රබර් කෑල්ල** -ඒ කතාව ඇත්ත තමයි. ඒ වුනාට ඉතින් ඒකට කමක් නෑ. මාව ඉපදිලා තියෙන්නෙ ඒ සඳහාමයි. ඔබ වැරැද්දක් කරන හැම වෙලාවෙම ඒ වැරැද්ද මකලා ඔබ නිවැරදි කිරීමයි මගේ කාර්යය. ඉතින් මම ඒක කරනවා. මම දන්නවා දවසක මං ඉවරවෙනවා කියලා. මං වෙනුවට ඔබ අළුත් කෙනෙ- ගනීවී. ඒකට කමක් නෑ. මගෙන් වන සේවයට මං සංතෝෂ වෙනවා. ඔයා දුක් වෙන්න එපා. මං කැමති නෑ ඔයා දුකෙන් ඉන්නවා දකින්න. ඒ තමයි ඉතින් මගේ හැටි. ”

පැන්සල සහ රබර් කැල්ලේ ඉහතකී දෙබස ගැන කල්පනා කරත්ම එය අප මෙලොව ගෙවන පවුල් ජීවිතවලට කොප මණ සමානකමක් ඇත් දැයි මට සිතිණ. මෙහිදී දෙමාපියන් මකන රබර් කෑල්ලට සමාන කළ හැකි නොවේද? දරුවෝ පැන්සලට සමාන වෙති.

දෙමාපියෝ දරුවන්ගේ හැම දෙයක්ම පිරිසිදු කරති. වැරදි මකා දමති. හරිගස්සති. ඔවුන් නිසා වේදනා විඳිති. දින දින ක්ෂය වී අඩුවී වැහැරීයති. තම අවසානය දක්වාම ඔවුන් ජීවිතයම කැප කර ඇත්තේ දරුවන් වෙනුවෙනි.

දරුවෝ වැඩී ලොකු මහත් වී සමහර විට ගෙදරින් බැහැරව යති. ඔවුන්ට සමාජයේ අළුත් යහළුවන් හිතවතුන් හමුවේ. ඔව්හු ජීවිත සහකරුවන් ද සොයා ගනිති. ඒ වන විටත් දෙමාපියන් ගේ කාර්යයෙහි නිමාවක් නොවේ. ඉරේසරය කියන්නාක් මෙන් දරුවන්ගේ සතුට ඔවුන්ගේද සතුටය.

♦ **කේසර මුදන්නායක**
Milton Keynes **UK**